# ශ්‍රී ලංකා ගණකාධිකරණ ශිල්පීය ආයතනය

## අදියර II විභාගය -2020 ජූලි

## යෝජිත උත්තර

## විෂය අංකය (203)

## (203) ව්‍යාපාර නීතිය (BLA)

**ශ්‍රී ලංකා ගණකාධිකරණ ශිල්පීය ආයතනය**
නො. 540, පූජ්‍ය මුරුත්තෙට්ටුවේ ආනන්ද නාහිමි මාවත,
නාරාහේන්පිට, කොළඹ 05.

දුරකථන : 011-2-559 669

**මෙය අධ්‍යාපන හා පුහුණු කිරීම් අංශයේ ප්‍රකාශනයකි.**

**ශ්‍රී ලංකා ගණකාධිකරණ ශිල්පීය ආයතනය**

**අදියර II විභාගය – 2020 ජූලි**

**(203) ව්‍යාපාර නීතිය**

**යෝජිත උත්තර**

අනිවාර්ය ප්‍රශ්න පහලොවකි (15)
(මුලු ලකුණු 25 )

**A කොටස**

## *01 වන ප්‍රශ්නය සඳහා යෝජිත උත්තර*

| *ප්‍රශ්න අංකය* | *උත්තරය යොමුව* |
|---|---|
| 1.1 | 3 |
| 1.2 | 4 |
| 1.3 | 2 |
| 1.4 | 3 |
| 1.5 | 2 |
| 1.6 | 4 |

(එකකට 02 බැගින් **ලකුණු 12**)

| | |
|---|---|
| 1.7 | සත්‍ය |
| 1.8 | සත්‍ය |
| 1.9 | අසත්‍ය |

(එකකට 01 බැගින් **ලකුණු 03**)

**ප්‍රශ්න අංක 1.10**

**පහත සඳහන් ඒවා අතුරින් ඕනෑම දෙකක් (02)**

- ආයෝජකයන් සමඟ ව්‍යාපෘති යෝජනා සාකච්ඡා කිරීම
- ස්ව - කැමැත්තෙන්ම දෙන ලද ව්‍යාපෘති භාර ගැනීම හා සමාලෝචනය කිරීම මෙන්ම ඒවා අදාළ ක්‍රියාමාර්ග ගැනීම සඳහා අදාළ රාජ්‍ය ආයතන වෙත ඉදිරිපත් කිරීම
- සුවිශේෂී වූ උපදේශන සහාය ලබා දීම හා අදාළ ලිපි ලේඛන සැකසීම
- බදු සහන හා අනෙකුත් සහන ලබා දීම
- අනාගත ආයෝජකයන්ට යටිතල පහසුකම් ව්‍යාපෘති අලෙවිකරණය කිරීම

**ප්‍රශ්න අංක 1.11**

**පහත සඳහන් ඒවා අතුරින් ඕනෑම දෙකක් (02)**

- භාණ්ඩ භාර නොදීම සම්බන්ධයෙන් ක්‍රියා කිරීම.
- නියත ඉටු කිරීමේ ආඥාවක් ලබා ගැනීම.
- ගිවිසුමේ කොන්දේසි කඩ කිරීම මත භාණ්ඩ ප්‍රතික්ෂේප කිරීමේ අයිතිය.
- ප්‍රතිඥාභාරයක් කඩ කර ඇති අවස්ථාවලදී වන්දි ලබා ගැනීමේ අයිතිය.
- මිල අය කර ගැනීම.

**ප්‍රශ්න අංක 1.12**

**පහත සඳහන් ඒවා අතුරින් ඕනෑම දෙකක්** (02)

- සේවය අවසන් වන අවස්ථාවකදී.
- නියමිත කාලයේදී විශ්‍රාම ගැනීමේදී.
- තනතුරෙන් පහ කිරීමකදී / ඉවත් කිරීමක දී.
- සේවයෙන් ඉල්ලා අස් වීමකදී.
- සේවය වෙනස් වීමකදී.

**ප්‍රශ්න අංක 1.13**

**පහත සඳහන් ඒවා අතුරින් ඕනෑම දෙකක්** (02)

- භාණ්ඩ හඳුනා ගැනීමට අවශ්‍ය පිරිවිකර
- භාණ්ඩවල ප්‍රමාණය තරම සහ බර.
- භාණ්ඩ වල ගුණත්වය.
- භාණ්ඩ ලබන්නාගේ නම සහ ලිපිනය.
- නැව්ගත කරන්නාගේ නම සහ ලිපිනය.
- ඇනවුම් අංකය / ඉන්වොයිස් අංකය.
- භාණ්ඩ භාර ගන්නා දිනය.

**ප්‍රශ්න අංක 1.14**

**පහත සඳහන් ඒවා අතුරින් ඕනෑම දෙකක්** (02)

- පාරිභෝගිකයාගේ ජීවිතයට හා දේපලවලට හානිදායක වන භාණ්ඩ හා සේවා ප්‍රවර්ධනය කිරීමට හා අලෙවියට එරෙහි වීම මගින් පාර්භෝගිකයන් ආරක්ෂා කිරීම.
- අසාධාරණ වෙළඳ පරිචයන්වලට එරෙහිව පාර්භෝගිකයා ආරක්ෂා කිරීම සහ පාරිභෝගික අවශ්‍යතා වෙනුවෙන් නිසි අවධානය ලබා දීම.
- හැකි සෑම අවස්ථාවකදීම තරගකාරී මිල ගණන් යටතේ පාරිභෝගිකයාට ප්‍රමාණවත් භාණ්ඩ හා සේවා ලබා ගැනීමට අවකාශ තහවුරු කිරීම.
- අසාධාරණ වෙළඳ පරිචයන්ට එරෙහිව, තහනම් කරන ලද වෙළඳ පරිචයන්ට එරෙහිව හෝ පාරිභෝගිකයා සූරා කෑමකට ලක් කරන ඕනෑම වෙළඳ පරිචයකට එරෙහිව කටයුතු කර අලාභ/හානි අය කර ගැනීම.

***(මුළු ලකුණු 25)***

**A කොටසෙහි අවසානය**

B කොටස

# 02 වන ප්‍රශ්නය සඳහා යෝජිත උත්තර

**05** වන පරිච්ඡේදය – හවුල් ව්‍යාපාර නීතිය

**හවුල් ව්‍යාපාර ආඥා පනතේ 30 වන වගන්තියේ** ප්‍රතිපාදන අනුව **හවුල්කරුවන්ගේ අනුදැනුමකින් තොරව හවුල් ව්‍යාපාරයේ ව්‍යාපාරයට සමාන තරඟකාරී ව්‍යාපාරයක් කරගෙන යාම මඟින් හවුල් ව්‍යාපාරය සමඟ තරඟ නොකර සිටීමට සෑම හවුල්කරුවෙකුටම යුතුකමක් ඇත.** හවුල්කරුවෙකු විසින් හවුල්කරුවන් අතර හවුල් ව්‍යාපාරයක් පවතින අවස්ථාවේදී මෙන්ම හවුල් ව්‍යාපාරයෙන් ඉවත්ව යාමකින් පසුව හවුල් ව්‍යාපාරික කටයුත්තට තරඟකාරී ව්‍යාපාර කටයුත්තක් පවත්වා ගෙන නොයා යුතුය. එසේ තරඟකාරී ව්‍යාපාරයක් පවත්වාගෙන යාමෙන් උපයන ලද ලාභයද හවුල් ව්‍යාපාරය උපයන ලද ලාභයක් ලෙස සැලකේ. ඒ අනුව යම් හවුල්කරුවෙක් විසින් හවුල් ව්‍යාපාරයට සමාන තරඟකාරී ව්‍යාපාරයක් පවත්වාගෙන ගොස් ඇත්නම් එකී ව්‍යාපාරයේ ලාභය හවුල් ව්‍යාපාරය වෙනුවෙන් ගිණුම්ගත කිරීමට ඔහුට සිදුවේ.

ඉහත සඳහන් කළ හවුල්කරුවෙකු සතු නෛතික යුතුකම පහත නඩුවේදී පැහැදිලි කොට ඇත.

*<u>Pillan Bros</u>* V *<u>Pillan Bros</u>*

මෙම නඩුවේදී සහෝදරියන් තිදෙනෙකු අතර හවුල් ව්‍යාපාරයක් පැවති අතර එක් තැනැත්තියක විසින් මෙම ව්‍යාපාරයට සමාන ස්භාවයේ එදිරිවාදී ව්‍යාපාරයක් අත්පත් කරගන්නා ලදී. එම එදිරිවාදී ව්‍යාපාරයේ ලාභයෙන් කොටසක් අනෙකුත් හවුල්කරුවන් දෙදෙනා වෙත ලබා දිය යුතු බව අධිකරණය තීරණය කරන ලදී.

ප්‍රශ්නගත සිදුවීමේදීද **සුමනා** සිය ස්වාමිපුරුෂයා සමඟ එක්ව **හෙළරස** ව්‍යාපාරයට සමාන තරඟකාරී ව්‍යාපාරයක් **හෙළරස** ව්‍යාපාරයේ ව්‍යාපාරික සබඳතාද භාවිතා කරමින් පවත්වාගෙන ගොස් ඇත. එසේම ඒ සම්බන්ධව අනෙකුත් හවුල්කරුවන් වන **නිමල් හා රාජාගේ** අනුමැතියක්ද දක්නට නොලැබේ.

ඉහත නඩු තීන්දුවේදී විස්තර කළ පරිදි **සුමනා** විසින් හවුල්කරුවෙක් සතු යුතුකම් කඩකොට ඇති නිසා ඇය විසින් තරඟකාරී ව්‍යාපාරක් පවත්වාගෙන යාම මඟින් උපයාගත් ලාභය හවුල් ව්‍යාපාරය වෙනුවෙන් ගිණුම්ගත කළ යුතුය. ඒ අනුව ඇය සහ ඇයේ ස්වාමි පුරුෂයා විසින් නව ව්‍යාපාරයක් පවත්වාගෙන යමින් ඉපයූ ලාභය **නිමල් හා රාජා** හවුල්කරුවන් වන හවුල් ව්‍යාපාරයට පවරා දිය යුතුය.

***(ලකුණු 06)***

***b)***

හවුල් ව්‍යාපාර අඥා පනතේ 05 වන වගන්තිය අනුව හවුල් ව්‍යාපාරයේ සෑම හවුල්කරුවෙක්ම හවුල් ව්‍යාපාරයේ සහ අනෙකුත් හවුල්කරුවන්ගේ නියෝජිතයෙක් වේ. ඒ අනුව සාමාන්‍ය ව්‍යාපාරික කටයුතු අතර හවුල්කරුවෙකු තමන්ට ඇති සත්‍ය බලයක් හෝ ව්‍යංග බලයක් භාවිතා කරමින් එළඹෙන්නා වූ ගිවිසුම්වලින් හා ඇතිකරගනු ලබන්නා ගණුදෙණුවලින් හවුල් ව්‍යාපාරයත් අනෙකුත් හවුල්කරුවනුත් වගකීමට බැඳිය යුතුය.

මෙහිදී වැදගත් කරුණක් වනුයේ එක් හවුල්කරුවෙක් හවුල් ව්‍යාපාරය නියෝජනය කරමින් තුන්වන පාර්ශවයක් සමඟ ඇති කරගත් යම් ගිවිසුමක් සඳහා අනෙක් හවුල්කරුවන් අවසර දී නොමැතිවුවද, ඔවුන් එකී ගිවිසුම පිළිබඳ නොදැනුවත් වුවද අනෙකුත් හවුල්කරුවන් එම ගිවිසුමෙන් වගකීමට බැඳෙන බවයි.

***<u>Mercantile Credit Co. Ltd</u>* v *<u>Garrod</u>* , *<u>Samuel Gnanam And Others</u>* v *<u>Ismail Lebbe</u>* and *<u>Golberg</u>* V *<u>Jenkins</u>*** යන නඩු තීන්දු මගින් ඉහත කී නීතිමය මූලධර්මය පැහැදිලි කොට ඇත.

***<u>Samuel Gnanam And Others</u>* v *<u>Ismail Lebbe</u>* and *<u>Golberg</u>* V *<u>Jenkins</u>***

මෙම නඩුවේදී හවුල්කරුවන් සිව් දෙනෙකු විසින් පවත්වාගෙන යන ලද හවුල් ව්‍යාපාරයක් වෙනත් සමාගමක් සමඟ භාණ්ඩ බෙදාහැරීමේ ගිවිසුමකට එළඹෙන ලද අතර එම ගිවිසුමට අත්සන් කරන ලද්දේ හවුල්කරුවන් කිහිපදෙනෙක් පමණි. මෙම ගිවිසුම උල්ලංඝණය කිරීම සම්බන්ධයෙන් අදාළ සමාගමට විරුද්ධව හවුල් ව්‍යාපාරය විසින් නඩු පවරන ලද

අතර එහිදී සමාගමේ තර්කය වූයේ හවුල්කරුවන් කිහිපදෙනෙකු අත්සන් කළ ගිවිසුමක් සම්බන්ධයෙන් හවුල් ව්‍යාපාරයට නඩු කටයුතු මෙහෙයවාගෙන යා නොහැකි බවයි. කෙසේ නමුත් එහිදී අධිකරණය දරන ලද මතය වූයේ එක් හවුල්කරුවෙක් ඇති කරගත් ගිවිසුමක් සම්බන්ධයෙන් මුදල් අයකර ගැනීම සඳහා නඩු පැවරීමේ හැකියාව අනෙකුත් හවුල්කරුවන්ට පවතින බවයි.

ඉහත සාකච්ඡා කරන ලද නීතිමය මූලධර්ම ප්‍රශ්නගත සිද්ධියට ආදේශ කිරීමේදී පෙනී යනුයේ හෙළරස හවුල් ව්‍යාපාරයේ සියලුම හවුල්කරුවන් **නිමල්** විසින් කුරුඳු සහ ගම්මිරිස් මිලට ගැනීම සඳහා **පියල්** සමග ඇති කරගත් ගිවිසුමෙන් වගකීමට බැඳෙන බවයි. හවුල් ව්‍යාපාරයේ සාමාන්‍ය ව්‍යාපාරික කටයුත්තක් ලෙස එම ගිවිසුම ඇතිකරගෙන ඇති බව පෙනී යයි. ඒ අනුව **රාජා හා සුමනා පියල්ට** රුපියල් හය ලක්ෂයක මුදලක් ගෙවීමට බැඳී සිටියි.

තව දුරටත් ප්‍රකාශ කළ හැක්කේ හවුල් ව්‍යාපාරයට එකී රුපියල් හය ලක්ෂය **නිමල්ගෙන්** අය කර ගැනීමට අයිතියක් ඇති බවයි.

***(ලකුණු 04)***
***(මුළු ලකුණු 10)***

## 03 වන ප්‍රශ්නය සඳහා යෝජිත උත්තර

### 04 වන පරිච්ඡේදය – නියෝජ්‍යාත්ව නීතිය

***a)*** දෙන ලද කරුණු අනුව පැහැදිලි වනුයේ **කුමුදු** විසින් ඇටර්නි බලපත්‍රයක් නොවන ලිඛිත ගිවිසුමක් මගින් ප්‍රකාශිතව ඇගේ නියෝජිතයා ලෙස **මාලකව** පත් කර ඇති බවයි. ඒ අනුව **මාලකට කුමුදු** වෙනුවෙන් ලිඛිතවත්, වාචිකවත් ගිවිසුම් වලට එළඹීමට බලය ඇත. කෙසේ නමුත් **මාලකට කුමුදු** වෙනුවෙන් ඔප්පුවලට අත්සන් කිරීමේ බලයක් නොමැත.

තව දුරටත් අවධානය යොමු කල යුතු කරුණක් වනුයේ මෙම ප්‍රකාශිත නියෝජිත්ව සම්බන්ධතාවය අවස්ථානුකූල කරුණු අනුව අවශ්‍යතාවයේ නියෝජිත්වයක් සහ ව්‍යංග නියෝජිත්වයක් කරා විහිදී යා හැකි බවයි.

***(ලකුණු 04)***

***b)*** i.
නියෝජිත්ව නීතිය අනුව නියෝජිතයා යම්කිසි කාර්යයන් සම්බන්ධයෙන් සිය ප්‍රධානියාගෙන් උපදෙස් පැතිය නොහැකි හදිසි අවස්ථාවක ප්‍රධානියා වෙනුවෙන් ගිවිසුමට එළැඹේ නම් එවැනි අවස්ථාවේදී අවශ්‍යතාවයේ නියෝජිත සම්බන්ධයක් ඇතිවී නියෝජිතයාගේ ක්‍රියාවෙන් ප්‍රධානියා වගකීමට බැඳේ.

අව්‍යශතාවයේ නියෝජ්‍යාත්වය ඇති වීම සඳහා පහත කරුණු සම්පූර්ණ විය යුතුය.

1. ප්‍රධානියාගෙන් උපදෙස් ලබා ගත නොහැකි තරමේ හදිසි අවශ්‍යතාවයන් උද්ගතව තිබිය යුතුය.
2. එය සත්‍ය වාණිජමය අවශ්‍යතාවයන් නිසා විය යුතුය.
3. නියෝජිතයා විසින් ප්‍රධානියා වෙනුවෙන් සද්භාවයෙන් ක්‍රියා කොට තිබිය යුතුය.
4. නියෝජිතයා විසින් ගන්නා ලද පියවර සාධාරණ හා විචක්ෂණශීලී විය යුතුය.
5. ප්‍රධානියා විසින් අදාල කරුණ සම්බන්ධව ඊට පටහැනි ආකාරයේ ප්‍රකාශිත උපදෙස් පූර්වයෙන් ලබා දී නොතිබිය යුතුයි.

***<u>Great Northern Railway Company</u>* V. *<u>Swafeeld,</u>*** නඩුව මගින් අවශ්‍යතාවය මත නියෝජිත්වය ඇති වීම යන සංකල්පය පිළිගෙන ඇති අතර නඩු තීන්දු මාලාවක් මගින් එම නීති මූලධර්මය පසුව අනුගමනය කොට ඇත.

එම නඩුවේදී එක් දුම්රිය ස්ථානයක සිට තවත් දුම්රිය ස්ථානයකට දුම්රියෙන් අශ්වයෙකු ප්‍රවාහනය කිරීමට දුම්රිය සමාගමට බාර දෙන ලදී. අශ්වයා නියමිත ගමනාන්තය තෙක් දුම්රියෙන් ප්‍රවාහනය කරණු ලැබුවද අශ්වයා බාර ගැනීමට කිසිවකු නොමැති නිසා දුම්රිය සමාගම අශ්වයා ස්තාලයකට ඇතුලත් කොට කෑම ද සැපයූහ. දින කීපයකට පසු

අයිතිකරු අශ්වයා ඉල්ලා සිටි විට ස්තාල වියදම් ගෙවන ලෙස අශ්වයාගේ අයිතිකරුගෙන් දුම්රිය සමාගම ඉල්ලා සිටි විට අයිතිකරු එය ප්‍රතික්ෂේප කරන ලදී. එම ප්‍රතික්ෂේප කිරීම හේතුකොට ගෙන දුම්රිය සමාගම විසින් පවරනු ලැබූ නඩුවේදී අධිකරණය ප්‍රකාශ කළේ නියෝජිතයා වශයෙන් දුම්රිය සමාගම බලයෙන් තොරව මෙසේ ගිවිසුමට එළැඹුනද එසේ කටයුතු කර ඇත්තේ අවශ්‍යතාවය මත නියෝජිතයා වශයෙන් වන හෙයින් අයිතිකරු ඉස්තාල වියදම් ගෙවිය යුතු බවයි.

ප්‍රශ්නගත කරුණු අධ්‍යනයය කිරීමේදී පෙනී යන්නේ ජලනල පද්ධතියේ ඇති වූ හදිසි බිඳවැටීම හදිසි තත්වයක් උද්ගතකර ඇති බවත් **මාලක** ඒ අවස්ථාවේදී සාධාරණ හා විචක්ෂණශීලීව සිය ප්‍රධානියා වන **කුමුදු** කෙරේ සද්භාවයෙන් **පොඩි බාස්** ලවා එම බිඳ වැටීම ප්‍රතිසංස්කරණය කර ඇති බවත්ය. ඇතිවූ හිදිසි තත්වය තුළ ප්‍රධානියාගෙන් උපදෙස් ලබාගැනීමට තරම් ප්‍රමාණත් වේලාවක් **මාලක** වෙත පැවති බව උපකල්පනය කිරීම අපහසුය. මන්දයත් ජලනල පද්ධතියේ බිඳ වැටීම ඉතා ඉක්මනින් අලුත් වැඩියා කළ යුතු නිසාය.

මේ අනුව පෙනී යන්නේ ප්‍රශ්නගත සිද්ධිය තුළදී අවශ්‍යතාවයේ නියෝජ්‍යත්වයක් ඇති වීමට අවශ්‍ය සියලුම සාධක සම්පූර්ණ වී ඇති බවත් එනිසා **මාලක** හා **කුමුදු** අතර අවශ්‍යතාවයේ නියෝජ්‍යත්වයක් පැන නැගී ඇති බවත්ය.

වලංගු නියෝජ්‍යත්ව සම්බන්ධතාවයක් තුළ ප්‍රධානියා වෙනුවෙන් නියෝජිතයා කරනු ලබන කාර්යයන්හි වගකීම ප්‍රධානියා විසින් දැරිය යුතුය. ඒ අනුව ජලනල අලුත්වැඩියාව වෙනුවෙන් පොඩි බාස්ට ගෙවිය යුතු සියලු වියදම් පියවීමට කුමුදු නෛතිකව වගකීමට බැඳේ.

***(ලකුණු 03)***

ii. ප්‍රශ්නගත සිදුවීම ව්‍යංග නියෝජත්වය පැන නැගීම හා සම්බන්ධ වේ.

යම් පුද්ගලයෙක් තමා වෙනුවෙන් පැවරු බලය වෙනත් පුද්ගලයෙකුට පැවරූ අවස්ථාවකදී නියෝජත්ව සම්බන්ධතාවය පැන නගී. මෙම බලය පැවරීම ප්‍රකාශිත බලය පැවරීමක් හෝ ව්‍යංග බලය පැවරීමක් විය හැකිය. මෙම සිදුවීම ව්‍යංග නියෝජත්වය හා සම්බන්ධ වේ.

ප්‍රධානියෙකු විසින් සිය නියෝජිතයා යම් තනතුරක තැබීම හේතුකොට ගෙන ප්‍රධානියා වෙනුවෙන් එම තනතුරේ කටයුතු කරගෙන යාමට අවශ්‍ය සාමාන්‍ය බලයෙන් කිසියම් කොටසක් ප්‍රකාශිතව දී නැති අවස්ථාවකදී නියෝජිතයා හට ප්‍රකාශිතව හිමි නොවුණද තනතුරේ ස්භාවය මත හෝ එම තනතුර සම්බන්ධ සාම්ප්‍රදායික හා පිළිගත් පරිචයන් අනුව ස්භාවිකවම ප්‍රධානියා වෙනුවෙන් කටයුතු කිරීමට බලය නියෝජිතයාට හිමිවීම ව්‍යංග නියෝජත්වයයි.

ප්‍රධානියා විසින් නියෝජිතයාව කළමණාකරු, කළමණාකරණ අධ්‍යක්ෂක, තැරැව්කරු, වෙන්දේසිකරු වැනි තනතුරු වල තැබීමේදී ප්‍රායෝගිකව බලයෙන් කොටසක් පමණක් ප්‍රකාශිතව ලබා දෙන අතර එසේ බලය නොදුන් කටයුතු කරගෙන යාමට නියෝජිතයාට ව්‍යංග බලයක් හිමිවේ.

එවැනි අවස්ථාවලදී නියෝජිතයා විසින් එවැනි ආකාරයේ සාමාන්‍ය නියෝජිතයෙකු විසින් සිදු කරනු ලබන ආකාරයේ යම් ක්‍රියාවක් කරණු ලබයි නම් එම ක්‍රියාවෙන් ප්‍රධානියා වගකීමට බැදිය යුතුය. සාමාන්‍ය ක්‍රියාවක් සම්බන්ධයෙන් ප්‍රධානියා විසින් පනවා ඇති සීමාවන් මෙහිදී අදාල නොවේ.

නියෝජිතයාට ප්‍රධානියා සමඟ පවත්නා සම්බන්ධතාවයේ ස්වරූපය මත ව්‍යංගයෙන් හිමිවන බලයට ප්‍රධානියා විසින් යම් සීමාවක් පනවා ඇත්නම් හා එම සීමාව පිළිබඳව තුන්වන පාර්ශවයන් දැනුවත් කර නොමැති නම් එකී සීමාව අභිබවමින් නියෝජිතයා ඇති කරගන්නා ගිවිසුමකින් පවා ප්‍රධානියා වගකීමට බැඳේ.

මෙම නිතිමය න්‍යාය ***Watteau*** **V** ***Fenwick*** නඩුවේදීද පැහැදිලි කර ඇත.

A විසින් B වික්ටෝරියා හෝටලයේ කළමණාකරු වශයෙන් පත්කරන ලදී.එමෙන්ම A,B ට සිගරට් ණයට ගැනීම තහනම් කළේය. මෙම තහනම නොසලකා B විසින් C ගෙන් සිගරට් ණයට ගන්නා ලදී. C, ඔහුට හිමි මුදල් A ප්‍රධානියා වශයෙන් ගෙවිය යුතු යැයි තර්ක කළ අතර A විසින් කියා සිටියේ තමාගේ බලයෙන් පිටත C කටයුතු කර ඇති නිසා තමා වගකීමට නොබැඳෙන බවයි. මෙම අවස්ථාවේ දී අධිකරණය ප්‍රකාශ කළේ B හට සිය ව්‍යංග බලය යටතේ හිමි වන බලයට ඇති සීමාව පිළිබදව C දැනුවත් කර නොමැති නිසා A හා B අතර ව්‍යංගයෙන් නියෝජ්‍යත්වයක් ඇතිවන බවත් ප්‍රධානියා ලෙස A අදාල මුදල C ට ගෙවිය යුතු බවත්ය.

දෙන ලද කරුණු අනුව පෙනී යනුයේ ප්‍රධානියා විසින් තේක්ක දැව අලෙවි නොකරන ලෙසට **මාලකට** පනවා ඇති සීමාව තුන් වන පාර්ශව වෙත සන්නිවේදනය කර නොමැති බවයි. ඒ අනුව ව්‍යංග නියෝජතවයක් පවතින බවත් **රේනුකට** ප්‍රධානියා වන **කුමුදුගෙන්** වන්දි ඉල්ලා සිටිය හැකි බවත් ප්‍රකාශ කළ හැකිය.

***(ලකුණු 03)***
***(මුළු ලකුණු 10)***

## 04 වන ප්‍රශ්නය සඳහා යෝජිත උත්තර

**08 වන පරිච්ඡේදය – රක්ෂණ, කල්බදු කුලී සින්නක්කර සහ ණය සම්බන්ධ නීතිය**

a. මෙය රක්ෂණ මූලධර්ම මත පදනම් වේ.

දේපල සම්බන්ධව ද්විත්ව රක්ෂණයක් ලබා ගෙන ඇති අවස්ථාවලදී දායකත්වය මූලධර්මය පැන නගී. එම මූලධර්මයට අනුව රක්ෂිත දේපලකට සිදු වන හානිය සියලු රක්ෂණ සමාගම් විසින් සමානුපාතිකව දරා ගත යුතු බව කියැවේ.

දායකත්ව මූලධර්මය අනුව රක්ෂණ වන්දි ගෙවිය යුතු ආකාරය පහත දැක්වේ.

වන්දි මුදල = $\frac{\text{අදාල රක්ෂණ සමාගම විසින් නිකුත් කර ඇති රක්ෂණ ඔප්පුවේ වටිනාකම}}{\text{සියලුම රක්ෂණ සමාගම් විසින් නිකුත් කර ඇති රක්ෂණ ඔප්පුවල වටිනාකම}}$ x සිදු වූ අලාභය

XYZ සමාගම විසින් ගෙවිය යුතු වන්දි මුදල = $\frac{3,000}{7,000}$ x500
= **214,285**

ABC සමාගම විසින් ගෙවිය යුතු වන්දි මුදල = $\frac{4,000}{7,000}$ x500
= **285,715**

ඒ අනුව **ඈන්** රක්ෂණ සමාගම් ද්විත්වයෙන්ම රුපියල් 500,000/- බැගින් ලබා ගැනීමට අයිතිවාසිකම් නොකියයි. කෙසේ නමුත් ඇයට ABC රක්ෂණ සමාගමෙන් රුපියල් 285,715/- ක් ද XYZ රක්ෂණ සමාගමෙන් රුපියල් 214,285/- ක් ද බැගින සිදු වූ සමස්ත අලාභය වන රුපියල් 500,000/- අය කර ගැනීමට අයිතියක් ඇත. රක්ෂණ සමාගම් ද්විත්වයම වන්දි ගෙවීමේදී සමානුපාතිකව දායක විය යුතුය.

***(ලකුණු 06)***

b.

**කුලී ගැණුම්කරුගේ වගකීම්**

- මූලික වගකීම වන්නේ කුලී සින්නක්කර ගිවිසුමට අනුගත වීමයි.
- භාණ්ඩ නිසි පරිදි රැකබලා ගැනීමට කුලී ගැණුම්කරු වෙත වගකීමක් ඇත.
- භාණ්ඩය පවතින ස්ථානය සහ භාණ්ඩවල තත්ත්වය පිළිබඳව භාණ්ඩ හිමිකරු දැනුවත් කළ යුතුය.
- වංචනික ලෙස විකිණීමෙන් හෝ භාණ්ඩ ප්‍රදර්ශනය කිරීමෙන් හෝ භාණ්ඩ හිමිකරුව රැවටීම හෝ ඔහුට වංචා කිරීම සිදු නොකළ යුතුය.
- භාණ්ඩය භාවිත නොකිරීම නිසා සිදුවන හානි වෙනුවෙන් භාණ්ඩ හිමිකරු වෙත වන්දි නොගෙවිය යුතුය.

**භාණ්ඩ හිමිකරුගේ වගකීම්**

- කුලී ගැණුම්කරු වෙත භාණ්ඩ වල නිදර්ශක සහ තොරතුරු ලබා දීම පිණිස භාණ්ඩ හිමිකරුට වගකීමක් පවතී.

***(ලකුණු 04)***
***(මුළු ලකුණු 10)***

## 05 වන ප්‍රශ්නය සඳහා යෝජිත උත්තර

**08 වන පරිච්ඡේදය – ගණුදෙණු කළ හැකි ලියවිලි සම්බන්ධ නීතිය**

i. විනිමය බිල්පත් ආඥා පනතේ 76(1) හා 76 (2) වගන්ති අනුව චෙක්පතක මුහුණත හරහා යෙදූ සරල සමාන්තර රේඛා දෙකක් මගින් හෝ වාණිජ බැංකුවක නමක් සඳහන් කිරීම මගින් චෙක්පතක් රේඛනය කළ හැකිය.

චෙක්පතක් රේඛනය කිරීම එම චෙක්පත සම්බන්ධයෙන් ගෙවීම් සිදුකළ යුතු ආකාරය සම්බන්ධයෙන් බලපෑම් ඇති කරයි. රේඛිත චෙක්පතක් දරන්නෙකුට එම චෙක්පත කවුන්ටරය හරහා මුදල් කරගැනීමේ හැකියාවක් නොමැත. චෙක්පතේ සඳහන් වටිනාකම බැංකු ගිණුමකට පැවරීම හරහා ලබාගත යුතුය. චෙක්පතක් රේඛනය කිරීම චෙක්පතක සැබෑ දරන්නාගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම සඳහා වැදගත් වෙයි. චෙක්පතක සරල සමාන්තර රේඛා දෙකක් අතර ඇති '' ගණුදෙණු කළ නොහැකිය'' යන යෙදුම රේඛිත චෙක්පතක් කවුන්ටරය හරහා මුදල් කරගත නොහැකිය යන මූලික රීතියට කිසිදු බලපෑමක් එල්ල නොකරයි.

ඒ අනුව මෙම චෙක්පත කවුන්ටරය වෙත ඉදිරිපත් කොට මුදල් කරවා ගැනීමට ප්‍රියාට හැකියාවක් නැත.

***(ලකුණු 04)***

II)

පහත අවස්ථාවන්හිදී ගණුදෙණුකරුවෙකු විසින් අණකෙරුණු චෙක්පත් සඳහා ගෙවීම් ප්‍රතික්ෂේප කිරීමට/ අගරු කිරීමට බැංකුකරුවෙකුට හැකියාව ඇත.

- ගණුදෙණුකරුගේ මරණය හෝ මානසික නොහැකියාව පිළිබඳ දැනුවත් වීමෙන්
- ගණුදෙණුකරුගේ බුන්වත්භාවය හෝ සංස්ථාපිත ගණුදෙණුකරුවෙකුගේ ඈවර කිරීම පිළිබඳ දැනුවත් වීමෙන්
- අණකරුගේ අත්සන පිළිබඳ සැකසහිත භාවයක් මතු වූ විටදී

- චෙක්පතෙහි අකුරින් සඳහන් වටිනාකම හා ඉලක්කමෙන් සඳහන් වටිනාකම් අතර පරස්පරතාවයක් දෘශ්‍යමාන වූ අවස්ථාවකදී
- සාමාන්‍ය ව්‍යාපාරික වේලාවකට පසු වේලාවකදී ගෙවීම් ලබා ගැනීම සඳහා ඉදිරිපත් කරන ලද්දේ නම්
- චෙක්පත පළුදු වී ඇති අවස්ථාවකදී
- පසු දාතම් චෙක්පතක් නම්
- චෙක්පත කල් ඉකුත් වී ඇති අවස්ථාවකදී
- චෙක්පතෙහි වාස්තවික වෙනස්කම් දර්ශනය වේනම්..
- චෙක්පත ප්‍රතිනියෝග කර ඇති අවස්ථාවකදී

ඉහත අවස්ථාවන් අතුරෙන් තුනක් දැක්වීම ප්‍රමාණවත් වේ.

***b)***

***07 වන පරිච්ඡේදය - කම්කරු නීතිය හා ආරවුල් බේරුම් කිරීමේ විකල්ප***

ලලිතා සේවය කරනු ලබන්නේ රෙදිපිළි වෙළඳසැලක වන බැවින් ඇය 1954 අංක 19 දරන සාප්පු හා කාර්යාල සේවක පනතින් ආවරණය වේ. ඒ අනුව එම පනතේ දක්වා ඇති ප්‍රසූත නිවාඩු ලබා ගැනීම සඳහා ඇය හිමිකම් කියයි.

**එම පනත අනුව දෙවන දරු ප්‍රසූතිය සඳහා සේවිකාවක් දින 84 ක වැටුප් සහිත නිවාඩුවක් සඳහා හිමිකම් කියයි.** එම නිවාඩුවෙන් දින 14 ක කාලයක් දරු ප්‍රසූතියට පෙරාතුව ලබා ගැනීමේ හැකියාවක් ඇත.

කෙසේ නමුත් අරලිය ටෙක්ස්ටයිල්ස් ආයතනය ඇයට හිමි ප්‍රසූත නිවාඩු ලබා දීම ප්‍රතික්ෂේප කොට ඇති අතර ඇය රැකියාවෙන්ද නෙරපා ඇත.

1954 අංක 19 දරන සාප්පු හා කාර්යාල සේවක පනතේ දක්වා ඇති ආකාරයට කිසිදු සේවිකාවක දරු ප්‍රසූතිය හේතු කොටගෙන රැකියාවෙන් නෙරපා හැරීමට සේවායෝජකයෙකුට හැකියාවක් නොමැත. ඒ අනුව අරලිය ටෙක්ස්ටයිල් ආයතනය විසින් සාප්පු හා කාර්යාල සේවක පනත උල්ලංඝණය කර ඇති බවට නිගමනයකට එළඹිය හැකිය.

එසේම සේවකයන්ගේ සේවය අවසන් කිරීමේ විශේෂ විධිවිධාන පනතේ 05 වන වගන්තියේ ප්‍රතිපාදන අනුව මෙම සේවා සමාප්ති කිරීම වලංගු නොවන සේවා සමාප්තියක් ලෙස හඳුනාගත හැකි අතර ඒ අනුව ලලිතාට ඇගේ සේවය අවසන් කිරීම පිළිබඳ වන්දි ඉල්ලා සිටීමට හෝ සේවයේ නැවත පිහිටුවන ලෙස ඉල්ලා සිටීමට අයිතිවාසිකම් ඇත.

***(ලකුණු 03)***
***(මුළු ලකුණු 10)***

## 06 වන ප්‍රශ්නය සඳහා යෝජිත උත්තර

**10 වන පරිච්ඡේදය – ව්‍යාපාර පරිසරය තුළ ප්‍රධාන වැරදි හා නව රෙගුලාසි**

**a)**

පහත දක්වා ඇති කරුණු අතරින් ඕනෑම කරුණු තුනක්

- මැන්ඩේට් / ගිණුම් විවෘත කිරීමේ පත්‍රය
- අනන්‍යතා ලේඛනයේ පිටපත

- ලිපිනය සත්‍යාපනය කිරීමේ ලේඛනවල පිටපත්
- පුරවැසි නොවන ගිණුම් (RNNFC/NRRA/RGFC) සම්බන්ධයෙන් වලංගු වීසා බලපත්‍රය
- ගිණුම ආරම්භ කරන ලද්දේ යම් ව්‍යාපාර කටයුත්තක් සඳහා නම් ව්‍යාපාරය ලියාපදිංචි කිරීමේ ලේඛණයේ පිටපත්

***(ලකුණු 03)***

**b)**

i.

පහත පනත් යටතේ වරදක් සංයුක්ත වන ඕනෑම ක්‍රියාවක් මුදල් විශුද්ධිකරණය වැළැක්වීමේ පනත යටතේ අපරාධමය ක්‍රියාවක් ලෙස අදහස් වේ.

- විෂ ද්‍රව්‍ය අබිං සහ අන්තරාදායක ඖෂධ ආඥා පනත
- ත්‍රස්තවාදය වැළැක්වීමට අදාළව බලපවත්නා යම් නීතියක් හෝ නියෝගයක්
- අල්ලස් පනත
- ගිනි අවි, පුපුරන ද්‍රව්‍ය හෝ අන්තරදායක ආයුධ පනත
- විනිමය පාලන පනත
- අන්තර්ජාතික සංවිධානාත්මක අපරාධ සම්බන්ධයෙන් බලපවත්නා යම් නීතියක් හෝ නියෝගයක්
- සයිබර් අපරාධ සම්බන්ධයෙන් බලපවත්නා යම් නීතියක් හෝ නියෝගයක්
- ළමුන්ට එරෙහි වැරදි හා පුද්ගල ජාවාරම සම්බන්ධයෙන් බලපවත්නා යම් නීතියක් හෝ නියෝගයක්
- මරණීය දණ්ඩණයෙන් හෝ අවුරුදු හතකට වඩා වැඩි කාලයක් සිර දඬුවම් පැමිණිවිය හැකි යම් වරදක් සංයුක්ත වන නීතියක්.

***(ලකුණු 04)***

ii.

පහත ක්‍රියාවන් 2007 අංක 07 දරන පරිගණක අපරාධ පනත යටතේ වැරදි ලෙස හඳුනාගැනේ.

- පරිගණකයන් වෙත අධිකාරිත්වයක් නොමැති ප්‍රවේශයන් පවත්වා ගැනීම සහ එකී ප්‍රවේශයන් වසන් කිරීම.
- නිතීවිරෝධී ක්‍රියාවක් කිරීම සඳහා පරිගණකයක් භාවිතා කිරීම හෝ වරදක් සිදු කිරීමේ පරමාර්ථයෙන් පරිගණකයක් භාවිතා කිරීම.
- පනතේ නිශ්චය කර ඇති පරිදි ,විශේෂිත,තොරතුරු විනාශ කිරීම මකා දැමීම හානි පැමිණවීම හෝ වෙනස් කිරීම.
- තමාට ළඟා විය නොහැකි දත්තයන් අයුතු පරිදි අත් කර ගැනීම, නිතීවිරෝධී පරිගණක අතුරු උපකරණ භාවිතය හෝ තමාට බලය නොමැති දත්ත අයුතු අයුරින් අනාවරණය කිරීම
- පරිගණකය භාවිතා කර වැරදි කිරීමට අනුබල දීම හෝ කුමන්ත්‍රණය කිරීම

***(ලකුණු 03)***
***(මුළු ලකුණු 10)***

**B කොටසෙහි අවසානය**

# 07 වන ප්‍රශ්නය සඳහා යෝජිත උත්තර

**02 වන පරිච්ඡේදය – ගිවිසුම් නීතිය**

*A.*

***(a) (i)***

ගිවිසුම් ප්‍රතිග්‍රහණය පිළිබඳ තැපැල් මාර්ගික රීතීය මෙහිදී අදාළ වේ.

ගිවිසුම් ප්‍රතිගහණය පිළිබඳ සාමාන්‍ය රීතිය වනුයේ ප්‍රතිග්‍රහණයක් අර්පණකරු වෙත නිල වශයෙන් සන්නිවේදනය වීමෙන් පසුව පමණක් වලංගු ප්‍රතිග්‍රහණයක් සේ සැලකීමයි. ඒ අනුව එකඟතාවයක් සම්පූර්ණ වීම සඳහා ප්‍රතිග්‍රහණය අනිවාර්ය වශයෙන් අර්පණකරු වෙත සන්නිවේදනය විය යුතුය.

කෙසේ නමුත් **තැපැල් මාර්ගික ගිවිසුම්** මෙම රීතියට ව්‍යතිරේඛයක් ලෙස සැලකේ.

තැපෑලෙන් ප්‍රතිග්‍රහණය කිරීමට ප්‍රකාශිතව හෝ ව්‍යංගයෙන් බලය දී ඇති විටකදී නිවැරදි ලිපිය, නිවැරදිව ලිපිනය ලියා, මුද්දර ගාස්තු ගෙවා තැපෑලට දැමූ වහාම ප්‍රතිග්‍රහණය වූ බවට සැලකේ. එම නිසා ප්‍රතිග්‍රහණ ලිපිය තැපෑලේදී නැති වුව ද, ප්‍රමාද වුව ද, වලංගු ප්‍රතිග්‍රහණයක් ලිපිය තැපෑලට දැමූ මොහොතේ දී ඇති වූ බව පිළිගැනේ.

මෙම රීතිය ශීඝ්‍ර තැපැල් න්‍යාය වශයෙන් හැදින්වේ. **Adams V Lindsay** රීතිය වශයෙන් හැඳින්වේ.

මෙම නඩුවේ දී A විසින් තම දේපළ B හට විකිණීමට තැපෑලෙන් අර්පණය කොට හැරෙන තැපෑලෙන් පිළිතුරක් අවශ්‍ය බව දැන්වීය. එය ලද වහාම B සිය ප්‍රතිග්‍රහණ ලිපිය තැපැල් කරන ලදී. තැපැල් නිළධාරීන්ගේ ප්‍රමාදයක් නිසා දින කිහිපයක් ප්‍රමාද ව A හට මෙම අර්පණ ලිපිය ලැබුණි. ප්‍රමාදය නිසා B විසින් අර්පණය ප්‍රතිග්‍රහණය නොකරන්නේ යැයි සිතා දින කිහිපයකින් A විසින් සිය දේපළ C වෙත විකුණා දැමීය. අධිකරණය මෙම සිද්ධිය ආශ්‍රිතව ප්‍රකාශ කළේ සිය ප්‍රතිග්‍රහණ ලිපිය තැපෑලට දැමූ වහාම ප්‍රතිග්‍රහණය සිදු වූවා සේ සලකන නිසා A හා B අතර වලංගු ගිවිසුමක් හට ගෙන ඇති බවයි.

ප්‍රශ්න ගත කරුණු අනුව පෙනී **යනුයේ වෛද්‍ය පෙරේරා** හා **බණ්ඩා** තැපැල් මඟින් ප්‍රතිග්‍රහණය කිරීම හෝ ප්‍රතික්ෂේප කිරීම සම්බන්ධයෙන් එකඟ වී ඇති බවයි. එමනිසා මෙම සිද්ධියට අදාළවද තැපැල් මාර්ගික රීතිය යොදා ගත හැකිය. දෙන ලද දත්ත අනුව පෙනී යනුයේ **බණ්ඩා** සිය ප්‍රතිග්‍රහණ ලිපිය පෙබරවාරි මස 18 වන දින තැපැල් කොට ඇති බවයි. ඒ අනුව **වෛද්‍ය පෙරේරා** හා **බණ්ඩා** අතර එදිනම වලංගු ගිවිසුමක් ඇති වී තිබේ.

ඒ අනුව **වෛද්‍ය පෙරේරාට බණ්ඩාගේ** කුරුඳු මිලට ගැනීම ප්‍රතික්ෂේප කළ නොහැකිය. මන්දයත් කුරුඳු සැපයීම ප්‍රතිග්‍රහණය කළ වලංගු ප්‍රතිග්‍රහණයක් පෙබරවාරි 18 වන දින වනවිට පැන නැගී ඇති බැවිනි.

**විකල්ප නඩු තීන්දු**

***Ceylon University* V *Fernando***

***Household Fire Carriage and Accident Insurance Company* V *Grant***

***ii)***

**ඒකපාර්ශවික ගිවිසුම් සම්බන්ධ මූලධර්ම මෙහිදී අදාළ වේ.**

ගිවිසුම් ප්‍රතිග්‍රහණය පිළිබඳ සාමාන්‍ය රීතිය වනුයේ ප්‍රතිග්‍රහණයක් අර්පණකරු වෙත නිල වශයෙන් සන්නිවේදනය වීමෙන් පසුව පමණක් වලංගු ප්‍රතිග්‍රහණයක් සේ සැලකීමයි. ඒ අනුව ඒකඟතාවයක් සම්පූර්ණ වීම සඳහා ප්‍රතිග්‍රහණය අනිවාර්ය වශයෙන් අර්පණකරු වෙත සන්නිවේදනය විය යුතුය.

කෙසේ නමුත් ඒකපාර්ශවික ගිවිසුම් මෙම මූලික රීතියට ව්‍යතිරේකීය අවස්ථාවකි.

කිසියම් අර්පණකරුවෙකු සිය අර්පණය මත ඍජුවම කටයුතු කිරීම සඳහා සිය අර්පණලාභියා හට බලය ලබා දී ඇති අවස්ථාවක එවැනි අර්පණයක් මත අර්පණලාභී විසින් කටයුතු කළ වහාම ප්‍රතිග්‍රහණය සිදු වූවා සේ සලකනු ලැබේ. එවැනි අවස්ථාවලදී ප්‍රතිග්‍රහණය සන්නිවේදනය විය යුතු නොවේ.

මෙම නීති තත්වය පැහැදිලි කරන වීරමන්ත්‍රී මහතා යූ. බවන් ගේ මතයක් උපුටා දක්වමින් සිය ග්‍රන්ථය තුළ සඳහන් කරනුයේ නැතිවූ බල්ලෙකු සොයා දෙන ලෙස පල කොට තිබූ දැන්වීමක් දකින පුද්ගලයෙකු බල්ලා සෙවීමට ප්‍රථම තමා බල්ලා සොයා දෙන බව අර්පණ කරුට දැන්විය යුතුද ? යන්න ප්‍රශ්න කොට තිබේ. ඉතා පැහැදිලිව එවැනි අවස්ථාවකදී බල්ලා සොයා දෙන  බව ප්‍රකාශ කිරීම අවශ්‍ය නොවන අතර බල්ලා සොයා දීමෙන් ගිවිසුම  ඉටු වූ ලෙස සලකනු ලැබේ. එවැනි ගිවිසුම් ඒකපාර්ශවික ගිවිසුම් ලෙස හඳුනා ගත හැකිය.

ඉහත විග්‍රහ කරන ලද නීතිමය තත්වය ***Carlill*** v ***Carbolic Smoke Ball Co.*** නඩු තීන්දුව මඟින්ද විග්‍රහ කොට ඇත.

මෙම නඩුවේ දී කාබොලික් දුම්බෝල සමාගම පුවත්පතක දැන්වීමක් පළ කරමින් සඳහන් කළේ තම සමාගම නව බෙහෙත් ද්‍රව්‍යයක් සොයා ගෙන ඇති බවත් ඒවා දිනකට තුන් වරක් සති 02 පාවිච්චි කරනු ලැබුවහොත් ඔහුට හෝ ඇයට සෙම්ප්‍රතිශ්‍යාව නොවැළඳෙන බවත්ය. එසේම දැන්වීමේ තව දුරටත් සඳහන් කර තිබුණේ එසේ පාවිච්චි කිරීමෙන් පසුව ද සෙම්ප්‍රතිශ්‍යාව සුව නොවුණහොත් ඔහුට හෝ ඇයට පවුම් 100 ත්‍යාගයක් පිරිනමන බවය. තම සමාගමේ අවංකභාවය ප්‍රකාශ කිරීම සඳහා මෙවැනි ඉල්ලීම්වලට ගෙවීම සඳහා දැනටමත් පවුම් 1000 බැංකුවක තැන්පත් කර ඇති බවත් බැංකුවේ නමත් දැන්වීමේ සඳහන් කරන ලදී. මෙම දැන්වීම කියවූ කලීල් මහත්මිය සති 03ක් දුම්බෝල නම් වූ මෙම ඖෂධය පාවිච්චි කළ ද  ඇගේ සෙම්ප්‍රතිශ්‍යාව සුව නොවූ හෙයින් පවුම් 100 ත්‍යාගය ඉල්ලා දුම්බෝල සමාගමට විරුද්ධව නඩු පැවරීය. එහි දී දුම්බෝල සමාගම තර්ක කරමින් කියා සිටියේ මෙම දැන්වීම කලීල් මහත්මිය වෙත සිදු නොකොට ඇති බැවින් කලීල් මහත්මිය සමඟ වලංගු ගිවිසුමක් ඇති නොවන බවයි. කෙසේ නමුත් මෙම තර්කය ප්‍රතික්ෂේප කළ අධිකරණය ප්‍රකාශ කර සිටියේ මුළු ලෝකයටම විවෘත අන්දමින් අර්පණයක් කළ හැකි බවත් එවැනි අර්පණයක් ඕනෑම අයෙකුට ප්‍රතිග්‍රහණය කළ හැකි බවත් එවැනි අර්පණයක් මත වලංගු ගිවිසුම් ඇති වන බවත්ය. ඒ අනුව ත්‍යාග මුදල ලබා ගැනීමට කලීල් මහත්මියට ගිවිසුම්මය අයිතිවාසිකමක් පවතින බව අධිකරණය තීරණය කරන ලදී.

ප්‍රශ්නගත සිදුවීමේදී **වෛද්‍ය පෙරේරා** විසින් පුවත්පතේ පලකළ දැන්වීම මුළු ලෝකයටම විවෘත අන්දමින් සිදුකළ අර්පණයක් ලෙස හඳුනාගත හැකිය.එවැන්නක් ඕනෑම පුද්ගලයෙක් වෙත කරන ලද අර්පණයක් ලෙස හඳුනාගත හැකි අතර එය ඕනෑම පුද්ගලයෙකුට ප්‍රතිග්‍රහණය කළ හැකිය. මෙහිදී ප්‍රතිග්‍රහණය අර්පණයේ සඳහන් ක්‍රියාව සිදු කිරීමෙන් කළ හැකි බව පෙනී යයි. ඒ අනුව මෙහිදී **වෛද්‍ය පෙරේරා** විසින් **විශාකා** වෙත වලංගු ප්‍රතිග්‍රහණයක් කර ඇති බැවිනුත්, ඇය **වෛද්‍ය පෙරේරාගේ** නිෂ්පාදිතය හිසකෙස් වර්ධනය සඳහා ගල්වා ඇති බැවිනුත් වලංගු ප්‍රතිග්‍රණයක් සිදු වී ඇති බව පෙනී යයි.

ඒ අනුව **වෛද්‍ය පෙරේරා** හා **විශාකා** අතර වලංගු ගිවිසුමක් පවතින බව ප්‍රකාශ කළ හැකිය.

***(ලකුණු 04)***

ප්‍රශ්නගත සිදුවීමේදී **වෛද්‍ය පෙරේරා** හා **බණ්ඩා** ප්‍රතිග්‍රහණය තැපැල් ප්‍රතිග්‍රහණය තැපැල් මාර්ගිකව සන්නිවේදනය කිරීමට එකඟ වී ඇත. තැපැල් මාර්ගික සන්නිවේදනයට අදාළ රීති අනුව ප්‍රතිග්‍රහණය සම්පූර්ණ වීම පිළිබඳව සලකා බැලිය යුතුය.

තැපැල් මාර්ගික රීතිය අනුව ප්‍රතිග්‍රහණ ලිපිය තැපෑලට දැමූ වහාම ප්‍රතිග්‍රහණය සම්පූර්ණ වූවා සේ සැලකේ. (තැපැල් මාර්ගික රීතිය අනුව අර්පණය සම්පූර්ණ වූවා සේ සලකනුයේ ලිපිය ලැබුණු දිනය නොවේ.) ප්‍රතිග්‍රහණ ලිපිය තැපෑලේදී ප්‍රමාද වී තිබුණද බණ්ඩා එකී ලිපිය පෙබරවාරි 18 වන දින තැපැල් කොට ඇති නිසා **බණ්ඩා** විසින් සඳහන් මිලට කුරුදු සැපයීම ප්‍රතිග්‍රහණය කර ඇති බව තැපැල් මාර්ගික රීතිය අනුව පෙනී යයි.

එමනිසා ඉහත කී ලිපිය **පෙරේරාගේ** නිවසට ලැබුණු 21 වන දිනය වැදගත් කාරණයක් නොවේ. ඒ අනුව **ශිවා** සමඟ පෙබරවාරි 19 වන දින එකඟතාවයකට පැමිණීම මගින් **වෛද්‍ය පෙරේරා බණ්ඩා** සමඟ ඇති කරගත් ගිවිසුම උල්ලංඝණය කොට ඇත.

ඉහත කරුණු අනුව බණ්ඩාට **වෛද්‍ය පෙරේරාට** එරෙහිව නීතිමය ක්‍රියාමාර්ග ගත හැකි බව පෙනී යයි. (Household Fire Insurance Co Vs.Grant)

ප්‍රශ්නගත සිදුවීමේදී **වෛද්‍ය පෙරේරා** ඔහුගේ දැන්වීම තුළ ඔහුගේ නිෂ්පාදිතය සපයන ලද මුද්‍රිත මඟ පෙන්වීම අනුව දිනකට තුන්වරක් බැගින් දින හයක් භාවිතා කිරීමෙන් පසු හිසකෙස් ගැලවී යාමක් හෝ ඕනෑම හානියක් වන අයෙකුට රුපියල් 10,000/- ක් ලබා දෙන බවට දැන්වීමක් පළ කොට ඇත.

මෙය හුදු අර්පණය සඳහා ආරාධනා කිරීමක් ඉක්මවා ගිය වලංගු එකඟතාවයක් සඳහා වන අර්පණයක් නිර්මාණය කරයි.

ඒ අනුව **විශාකාට වෛද්‍ය පෙරේරාට** එරෙහිව නීතිමය ක්‍රියාමාර්ග ගනිමින් අයගේ කොණ්ඩය අහිමි වීම සඳහා වන්දි ලබාගත හැකිය.

***(ලකුණු 07)***

## 03 වන පරිච්ඡේදය – භාණ්ඩ විකිණීමේ නීතිය

*B. **(a)***

මෙම තත්වය **භාණ්ඩවල අයිතිය මාරුවීමට අදාළ රීතීන්** මගින් විග්‍රහ කළ හැකිය. රවී සහ මොහාන් ඇතිකරගත් ගිවිසුමේ ස්වභාවය අනුව භාණ්ඩවල අයිතිය මාරුවීම පිළිබඳ කිසියම් ප්‍රකාශිත එකඟතාවයක් ඇති වී නොමැති බව පෙනී යයි.ඒ අනුව ගංවතුරෙන් භාණ්ඩවලට සිදු වූ හානියෙහි ප්‍රථිඵල විග්‍රහ කිරීම සඳහා **භාණ්ඩ විකිණීමේ අඥා පනතේ 19 වන වගන්තිය මගින් දක්වා ඇති රීතීන්** අධ්‍යයනය කළ යුතුය.

භාණ්ඩ විකිණීමේ අඥා පනතේ දක්වා ඇති රීතී අංක 05 අනුව භාණ්ඩ විකිණීමේ ගිවිසුමක විෂය වස්තුව වූයේ අවිනිශ්චිත භාණ්ඩයක් නම් එහි අයිතිය මාරු වනුයේ දෙපාර්ශවයේ ප්‍රකාශිත හෝ ව්‍යංග එකඟතාවයක් මත එම අවිනිශ්චිත භාණ්ඩ ගිවිසුමට අදාළව නිශ්චිතව හා කොන්දේසි විරහිතව වෙන්කළ විට පමණි.

මෙම නීති තත්වය පැහැදිලි කරන නඩු තීන්දු මාලාවක් ලෙස ***Pignataro*** v ***Gilroy***, ***Healy*** v ***Howlett & sons*** and ***East Port Navigation Corporation Case*** යන නඩු තීන්දු හඳුනාගත හැකිය.

***Pignataro*** v ***Gilroy*** නඩුවේදී අධිකරණය විසින් පහත කරුණු ප්‍රකාශ කරන ලදී.

Pignataro, Gilroy ගෙන් හාල් බෑග් 140ක් මිල දී ගැනීමට පෙබරවාරි 27 දින චෙක්පතක් එව්වේ ය. ඒ සඳහා නිකුත් කිරීමේ නියෝගයක් ද ඉල්ලා සිටි අතර Gilroy එය ද නිකුත් කළේ ය. මින් බෑග් 125ක් රැගෙන ගිය අතර හාල් බෑග් 15ක් Gilroy ගේ ව්‍යාපාර ස්ථානයේ ඉතිරිව තිබුණි. එය මාර්තු 25 දින වන තුරුත් Pignataro රැගෙන ගියේ නැත. එදින ඒවා සොරකමට ලක්ව තිබූ අතර එම සොරකමට Gilroy ගේ කිසිම නොසැලකිල්ලක් ද හේතු වී තිබුණේ ද නැත. Pignataro අලාභ ඉල්ලා Gilroy ට විරුද්ධව නඩු පැවරූ අතර අධිකරණය තීරණය කළේ Pignataro ගේ කැමැත්ත ඇතිව Gilroy කොන්දේසි විරහිතව එම භාණ්ඩ ගිවිසුමට අදාළ කර තිබූ නිසා එහි හිමිකම Pignataro ට මාරු වී ඇති බවත් Gilroy ට එරෙහිව නඩු පැවරිය නොහැකි බවත් ය.

ප්‍රශ්නගත සිදුවීමේදීද රවී විසින් මොහාන් වෙනුවෙන් පරිප්පු කිලෝ ග්‍රෑම් 100ක් වෙන් කොට ඇත. ඒ සම්බන්ධව මොහාන්ගේ අනුමැතිය ලැබී ඇති බව මොහාන්ගේ ඉල්ලීම පරිදි වෙන් කර තිබීමෙන් පැහැදිලි වේ. ඒ අනුව පරිප්පු කිලෝ ග්‍රෑම් 100 අයිතිය එකී පරිප්පු මොහාන් වෙනුවෙන් වෙන්කළ අවස්ථාවේදී මොහාන් වෙත පැවරී ඇති බව පෙනීයයි. ඒ අනුව පරිප්පුවලින් සිදුවූ අලාභය මොහාන් විසින් දරාගත යුතු බව පැහැදිලි වේ. මොහාන්ට පරිප්පු භාර ගැනීම ප්‍රතික්ෂේප කරමින් නැවත මුදල් ඉල්ලා සිටීමට කිසිදු නෛතික අයිතිවාසිකමක් නොමැත.

***(ලකුණු 05)***

***(b)***

මෙය භාණ්ඩ විකිණීමේ ආඥා පනතේ ව්‍යංග කොන්දේසි මත පදනම් වේ.

භාණ්ඩ විකිණීමේ ආඥා පනතේ 15(2) වගන්තියේ ප්‍රතිපාදන අනුව, "විකුණුම්කරු සිය සාමාන්‍ය ව්‍යාපාර කටයුතු අතර භාණ්ඩ විකිණීම කරනු ලබයි නම් විකුණුම්කරු විකුණනු ලබන්නා වූ භාණ්ඩ වෙළෙඳ තත්වයේ තිබිය යුතුය. එනම් කිසියම් භාණ්ඩයක් සාමාන්‍යයෙන් ප්‍රයෝජනයට ගනු ලබන්නේ කිසියම් අරමුණක් සඳහා ද විකුණුම්කරු විසින් විකුණන ලබන භාණ්ඩය ඒ සඳහා සුදුසු විය යුතුය.

භාණ්ඩ විකිණීමේ අඥා පනතේ 15(2) වගන්තිය ශ්‍රී ලංකා අභියාචනාධිකරණය මගින් ***G.W.P Gunawardena*** V ***Ceylon Steel corporation*** නඩුවේදී විග්‍රහ කොට ඇත.

මෙම නඩුවේදී ගැණුම්කරු විසින් වී තම්බන හා වේලන යන්ත්‍රයක් මිලට ගත් නමුත් එම යන්ත්‍රය නිසි පරිදි ක්‍රියාත්මක නොවූ අතර තම්බන හා වේලන ලද හාල් වර්ණය වෙනස් වීම, අපිරිසිදු වීම වැනි තත්වයන්ට ලක් විය. ශ්‍රී ලංකාවේ අභියාචනාධිකරණය මේ සම්බන්ධයෙන් කියා සිටියේ යන්ත්‍රය වෙළඳ තත්වයේ නොමැති බවයි.

තව දුරටත් ***Howell*** V ***Coupland*** නඩුවේදී ද මෙම නීති තත්වය විග්‍රහ කරන ලදී.

මෙම නඩුවේදී ගැණුම්කරු විසින් මාලු අලෙවිකරුවෙකුගෙන් අලුත් කකුලුවන් ඉල්ලා සිටි අතර අලුත් කකුලුවන් තමා සතු නොවන බැවින් තම්බන ලද කකුලුවන් විකුණන ලදී. එම තම්බන ලද කකුලුවන් ආහාරයට ගැනීම නිසා ගැණුම්කරු රෝගාතුර වූ අතර අධිකරණය ඒ සම්බන්ධයෙන් කියා සිටියේ විකුණන ලද භාණ්ඩ වෙළඳ තත්වයේ නොමැති බවයි.

**ජෝන්** විසින් මිලදී ගත් පරිප්පු ගංවතුරෙන් හානියට පත්වීම නිසා සාමාන්‍ය භාවිත අරමුණට උචිත නොවන ඒවා වේ. ඒ අනුව **රවී** භාණ්ඩ විකිණීමේ ආඥා පනතේ ව්‍යංග කොන්දේසි උල්ලංඝණය කර ඇති බව පෙනී යයි.

එසේම තව දුරටත් භාණ්ඩ විකිණීමේ ආඥා පනතේ 15(1) වගන්තියේ ප්‍රතිපාදන අනුව විකුණුම්කරු විකුණනු ලබන භාණ්ඩ ගැණුම්කරුගේ අවශ්‍යතාවයට සුදුසු විය යුතුය. ජෝන් විසින් පරිප්පු ඉල්ලා සිටිමේදී සිය අවශ්‍යතාවය ව්‍යංගව රවී වෙත සන්නිවේදනය කොට ඇති බවද පෙනී යයි.

මෙම නීති තත්වය නඩුවේදී අධිකරණ විසින් විග්‍රහ කොට ඇත.

මෙහිදී විකුණුම්කරු විසින් විෂබීජ සහිත කිරි විකුණා තිබුණි. ඒවා මිල දී ගත් ගැණුම්කරු පාරිභෝජනය කළ විට ගැණුම්කරු මිය ගියේය. අධිකරණය ප්‍රකාශ කළේ කිරි අවශ්‍යතාවය සඳහා සුදුසු නොවන නිසාද, ගැණුම්කරුගේ අවශ්‍යතාවය ව්‍යංගව සන්නිවේදනය වී ඇති බැවින්ද විකුණුම්කරු අලාභ ගෙවීමට වගකීමට බැඳෙන බවයි.

ඒ අනුව පෙනී යන්නේ රවී විසින් භාණ්ඩ විකිණීමේ ආඥා පනතේ ව්‍යංග කොන්දේසි දෙකක් උල්ලංඝණය කර ඇති බවයි. එම නිසා ජෝන්ට රවීට එරෙහිව නඩු පවරමින් භාණ්ඩ විකිණීමේ අඥා පනත දක්වා ඇති ප්‍රතිකර්ම වෙත යොමු වීමේ හැකියාවක් පවතී. කෙසේ නමුත් පවත්නා තත්වය අනුව පෙනී යන්නේ ජෝන්ට ඇති සුදුසුම විකල්පය රවීට එරෙහිව නඩු පවරා සිදුවූ අලාභය අය කරගැනීම බවයි

**<u>අතිරේක නඩු තීන්දු</u>**

***<u>Wren</u>*** V ***<u>Holt</u>***
***<u>Millars of Falkirk Ltd</u>*** V ***<u>Turpie</u>***
***<u>Grant V Australian Knitting Mills Compan</u>***

***(ලකුණු 05)***
***(මුළු ලකුණු 25)***

SRI LANKA

## *Notice:*

These answers compiled and issued by the Education and Training Division of AAT Sri Lanka constitute part and parcel of study material for AAT students. These should be understood as Suggested Answers to question set at AAT Examinations and should not be construed as the "Only" answers, or, for that matter even as "Model Answers". The fundamental objective of this publication is to add completeness to its series of study texts, designs especially for the benefit of those students who are engaged in self-studies. These are intended to assist them with the exploration of the relevant subject matter and further enhance their understanding as well as stay relevant in the art of answering questions at examination level.

*© 2020 by the Association of Accounting Technicians of Sri Lanka (AAT Sri Lanka). All rights reserved. No part of this document may be reproduced or transmitted in any form or by any means, electronic, mechanical, photocopying, recording or otherwise without prior written permission of the Association of Accounting Technicians of Sri Lanka (AAT Sri Lanka)*